# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2332/15 - 2023 මැයි මස 17 වැනි බදාදා - 2023.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/2011

විධාන අංක : 91

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වන වගන්තිය යටතේ වූ විශේෂ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ මා වෙත පැවරී අති බලතල ප්‍රකාර, පාරිභෝගික කටයුතු අධිකාරියේ සභාපතිවරයා වන ශාන්ත නිරිඇල්ල වන මා විසින්, පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා, යම් භාණ්ඩයක් අලෙවියෙහි සහ විකිණීමෙහි නිරත වන විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින්, එකී අලෙවිය සහ විකිණීම හා සම්බන්ධ වන්නා වූ උපලේඛනයේ 2 වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති යම් කටයුත්තක් කරගෙන යාමේ දී, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අදියර තුනෙහි දී එකී උපලේඛනයේ 3 වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූල විය යුතු බවට මෙයින් විධානය කරනු ලැබේ.

**සභාපති,**
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2023 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

මේ විධානයේ කාර්යය සඳහා -

''විද්‍යුත් වාණිජ්‍යය'' යන්නෙන්, අන්තර්ජාලය හෝ වෙනත් තොරතුරු ජාල හරහා භාණ්ඩ සේවා හෝ ඩිජිටල් අන්තර්ගතයන් විකිණීමේ ව්‍යාපාර කටයුතු අදහස් වේ;

''විද්‍යුත් වාණිජ්‍යය අස්ථිත්වයක්'' යන්නෙන්, මාර්ගගත වෙළෙන්දන් සහ අන්තර්ජාල වෙළඳ වේදිකාවල මෙහෙයුම් සිදුකරන වෙළෙන්දන් අදහස් වේ;



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

''මාර්ගගත වෙළෙන්දා'' යන්නෙන්, යම් භාණ්ඩ විකුණන්නෙකුට අයත් වෙබ් අඩවියක් හෝ එකී භාණ්ඩ විකුණන්නාට අයත් හෝ එම විකුණන්නා විසින් පාලනය කරනු ලබන වෙනත් තොරතුරු ජාලයක් හරහා යම් විද්‍යුත් වාණිජ්‍යය කටයුත්තක් සිදුකරන භාණ්ඩ විකුණන්නකු අදහස් වේ;

''අන්තර්ජාල වෙළඳ වේදිකාව'' යන්නෙන්, භාණ්ඩ, සේවා හෝ ඩිජිටල්/විද්‍යුත් ජාලයක ඩිජිටල් අන්තර්ගතයන් මිල දී ගැනීම සඳහා අන්තර්ජාල වෙළඳ වේදිකාවල මෙහෙයුම් සිදුකරන භාණ්ඩ විකුණන්නන් සමග සම්බන්ධ වීමට පාරිභෝගිකයන්ට ඉඩ සැලසීමෙන්, එවැනි ඩිජිටල් හෝ විද්‍යුත් ජාල හරහා අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්වල නිරත භාණ්ඩ විකුණන්නන්ට විද්‍යුත් වාණිජ්‍ය කටයුතු සිදු කිරීමට ඉඩ සලසන්නා වූ ඩිජිටල් හෝ විද්‍යුත් ජාලයක් අදහස් වේ;

''අන්තර්ජාල වෙළඳ වේදිකාව මෙහෙයුම්කරුවන්'' යන්නෙන්, අන්තර්ජාල වෙළඳ වේදිකාවක් අයත් හෝ මෙහෙයවන තෙවන පාර්ශවයක් අදහස් වේ

''අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම් සිදුකරන විකුණුම්කරුවන්'' යන්නෙන්, පාරිභෝගිකයන්ට භාණ්ඩ විකුණන හෝ අර්පණය කරන විද්‍යුත් වාණිජ භාණ්ඩ විකුණන්නෙකු අදහස් වේ.

## උපලේඛනය

| ගණුදෙනුවේ අදියර | කටයුත්ත | කොන්දේසි |
|---|---|---|
| පූර්ව මිලදී ගැනීමේ අවධිය | (1) සාධාරණ වෙළඳාම, වෙළඳ ප්‍රචාරණය සහ අලෙවි පරිචයන් | යම් විද්‍යුත් වාණිජ අස්තිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් -<br><br>(අ) යම් භාණ්ඩයක වෙළඳ ප්‍රචාරණය කරන විට, කිසිදු නියෝජනයක් හෝ කරුණු අත්හැරීමක් නොකළ යුතු අතර, රවටන සුළු, නොමග යවන සුළු කරුණු හෝ තරග මර්ධන කරන යම් පරිචයන්වල නිරත නොවිය යුතු ය;<br><br>(ආ) භාණ්ඩ සඳහා වන විශේෂ අර්පණ හෝ නොමිලේ අත්හදා බැලීම සම්බන්ධයෙන් වන විට, විකිණීම හෝ අර්පණයට අදාළ කාලය සහ, එකී අර්පණයේ හෝ අත්හදා බැලීම යටතේ විස්තර කර නොමැතිව අය කර ගත හැකි වෙනත් ගාස්තු ද ඇතුළුව, එකී අර්පණය හෝ නොමිලේ අත්හදා බැලීම සඳහා සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු අවශ්‍යතා පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කළ යුතු ය;<br><br>(ඇ) යම් අර්පණයකට හෝ විකිණීමකට අදාළ සියලු ප්‍රධාන කොන්දේසි ඒවා නිශ්චිතව දක්වා ඇති පාඨය තුළ පහසුවෙන් වටහා ගත හැකි, කියවිය හැකි සහ අවබෝධ කරගත හැකි පරිදි අන්තර්ගත වී ඇති බවට සහතික විය යුතු ය;<br><br>(ඈ) භාණ්ඩයක සත්‍ය ගැනුම් මිල ඒ භාණ්ඩය සඳහා අන්තර්ජාල වෙළඳ වේදිකාවේ දර්ශනය කර ඇති මිලම බවට සහතික විය යුතු ය;<br><br>(ඉ) වෙළඳ ප්‍රචාරණවල දී වැරදි හෝ නොමඟ යවන සුළු වූ මිල සම්බන්ධයෙන් වන හිමිකම්පෑම්වලට එරෙහිව වගකීම් අත්හැරීමේ වගන්ති භාවිත නොකළ යුතු ය; සහ<br><br>(ඊ) යම් ව්‍යාපාර කටයුත්තක් කරගෙන යාමේ දී, අදාළ අවස්ථාවල දී, 2003 අංක 9 පාරිභෝගික කටයුතු අධිකාරිය පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූල විය යුතු ය; |

(2) ඉල්ලීමකින් තොරව යවනු ලබන ඊ-මේල්, කෙටි පණිවිඩ ආදිය

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අනතර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින්, ඉල්ලීමකින් තොරව වාණිජ විද්‍යුත් පණිවිඩ, කෙටි පණිවිඩ ආදිය ලබා ගැනීමේ හෝ ලබා නොගැනීමේ වරණය තෝරාගැනීමට පාරිභෝගිකයන්ට ඉඩ සලසන්නා වූ කාර්යක්ෂම සහ භාවිතයට පහසු ක්‍රියාමාර්ග ඇති කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

(3) පාරිභෝගික සමාලෝචන

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් -

(අ) පාරිභෝගිකයන්ගේ සමාලෝචන එකතු කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා සාධාරණ හා විනිවිදභාවයෙන් යුතු ඇගයීම් හා සමාලෝචන යාන්ත්‍රණයක් පවත්වාගෙන යා යුතු ය;

(ආ) පාරිභෝගිකයන්ගේ ඇගයීම් සහ සමාලෝචන සම්බන්ධයෙන් අසත්‍ය ඇගයීම් සමාලෝචන ප්‍රකාශයට පත් නොකළ යුතු ය;

(ඇ) ඇගයීම් සහ සමාලෝචන යාන්ත්‍රණයේ දී ඇගයීම් සහ සමාලෝචන යොමු කිරීමට තුන්වන පාර්ශ්වයන් කුලියට යොදා නොගත යුතු ය;

(ඈ) පාර්භෝගිකයන් විසින් යොමු කළ ඇගයීම් සහ සමාලෝචන වෙනුවෙන් ඔවුන්ට සපයනු ලබන යම් දිරි දීමනා පිළිබඳ පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන පරිදි කරුණු අනාවරණය කළ යුතු ය;

(ඉ) පාරිභෝගිකයන්ගේ ඇගයීම් සහ සමාලෝචනවල ධනාත්මක හෝ ඍණාත්මක ස්වභාවය නොසලකා පාරිභෝගිකයන් විසින් යොමු කළ සියලු ඇගයීම් සහ සමාලෝචන සමානව සැලකිය යුතු අතර, ඍණාත්මක සමාලෝචන හෝ ඇගයීම් අධෛර්යමත් කිරීමට ප්‍රයත්න නොදැරිය යුතු ය;

(4) තොරතුරුවල විනිවිද භාවය

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් -

(අ) නොමඟ යවන සුළු නොවන ආකාරයකින් භාණ්ඩ හෝ ඇගයීම් ඇතුළු ව්‍යාපාර කටයුතුවලට අදාළ සියලු තොරතුරු ප්‍රකාශයට පත් කළ යුතු ය;

(ආ) එවැනි විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු සමඟ සම්බන්ධවීම පිණිස, යෝග්‍ය වූ ත්, ප්‍රවේශවිය හැකි වූ ත් සන්නිවේදන යාන්ත්‍රණයක් පාරිභෝගිකයන් උදෙසා පිහිටවිය යුතු ය.

(5) දත්ත රැස්කිරීම

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් -

(අ) පාරිභෝගිකයන්ගේ පෞද්ගලික දත්ත ලබාගන්නා විට ඔවුන්ට පෞද්ගලිකත්වය පිළිබඳ ප්‍රකාශනයක් යැවිය යුතු ය;

(ආ) පාරිභෝගිකයන්ට, ඔවුන්ගේ පෞද්ගලික දත්ත යෙදවුම් තොරතුරු යථාවත් කිරීම සඳහා, ඒවා සමාලෝචනය හා සංස්කරණය කිරීම පිණිස ඒවාට ප්‍රවේශ ක්‍රියාමාර්ග සකස් කළ යුතු ය;

ගැනීමේ අවධිය

(1) ඇණවුම් තහවුරු කිරීම

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් යම් ඇණවුමක් තහවුරු කිරීමට පෙරාතුව ඇණවුමේ ලුහුඬු සටහනක් සමාලෝචනය කිරීමේ අවස්ථාව පාරිභෝගිකයන්ට සැලසිය යුතු ය.

(2) ගණුදෙනුවල විනිවිදභාවය

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් -

(අ) යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් පාරිභෝගිකයෙකුගේ තීරණයකට බලපෑම් විය හැකි යම් ගනුදෙනුවකට අදාළ වන නියම සහ කොන්දේසි අසත්‍ය ලෙස නියෝජනය කිරීම හෝ සැඟවීම නොකළ යුතු ය ;

(ආ) නොමඟ යවන සුළු ගිවිසුම් පද භාවිත නොකළ යුතු අතර, ගනුදෙනුවේ අදාළ නියම සහ කොන්දේසිවල පැහැදිලි සහ සම්පූර්ණ ප්‍රකාශනයක් පාරිභෝගිකයන්ට සැපයිය යුතු ය;

(ඇ) යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් කරුණු දැන ඒ පිළිබඳ තීරණයක් ගැනීමට පාරිභෝගිකයාට ඉඩ සැලසීමට තරම් ප්‍රමාණවත් වන, ඒ ගනුදෙනුවට අදාල නියම, කොන්දේසි සහ පිරිවැය සම්බන්ධ තොරතුරු සැපයිය යුතු ය;

(ඈ) ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පාරිභෝගිකයන් භාවිතා කරන උපකරණය හෝ අන්තර්ජාල වෙළඳ වේදිකාව සමඟ අනුරූපවන ආකෘතියකින් ගනුදෙනුව පිළිබඳ සම්පූර්ණ, නිවැරදි සහ කල්පවත්නා වාර්තාවක් තබා ගැනීමට පාරිභෝගිකයන්ට ඉඩ සැලැස්විය විය යුතු ය;

(ඉ) අදාළ වන සහ සුදුසු අවස්ථාවල දී -

(i) අදාළ විද්‍යුත් වාණිජ අස්ථිත්වයෙන් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවා විසින් අය කරන හෝ පනවන සියලු ස්ථාවර ගාස්තු ඇතුළු මිල;

(ii) පාරිභෝගිකයා විසින් ගණුදෙනුව තහවුරු කිරීමට පෙර අදාළ විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවෙකු විසින් එකතු කළ හෝ පනවන ලද යම් (ස්ථාවර හෝ විචල්‍ය) අනිවාර් හෝ විකල්ප ගාස්තු සම්බන්ධයෙන් වන තොරතුරු;

(iii) යම් තුන්වන පාර්ශවයක් විසින් එකතු කළ හෝ පනවන ලද, සාමාන්‍යයෙන් ආදාළ වන, වෙනත් යම් පිරිවැයක් (ප්‍රත්‍යාවර්තක ගාස්තු) පාරිභෝගිකයෙකු සම්බන්ධයෙන් වේ නම්, ඒ පිළිබඳ තොරතුරු ;

(iv) අදාළ වන අවස්ථාවක දී සහ අදාළ වන විට දී, ස්වංක්‍රීය නැවත මිලදී ගැනීම් සහ දායක මුදල් අලුත් කිරීම් සහ එවැනි ස්වංක්‍රීය සහ අලුත් කිරීමේ වැඩ පිළිවෙලවල් වලින් බැහැර වීමේ මාර්ග වැනි පුනරාවර්තන අයකිරීම්වල ගිවිසුම් කාලසීමා ඇතුළු ගෙවීමේ සහ වෙනත් නියම සහ කොන්දේසි ;

(v) භාණ්ඩ ප්‍රවාහනයට අදාළ නියමයන් ;

(vi) ඉවත් කර ගැනීම්, අවසන් කිරීම් හෝ අවලංගු කිරීම්, පසු විකුණුම් සේවා, ආපසු යැවීම්, හුවමාරු කිරීම්, ආපසු ගෙවීම්, ප්‍රතිඥාභාර සහ වගකීමේ සහතිකවලට අදාළ කොන්දේසිවලට සම්බන්ධ තොරතුරු ;

(vii) පෞද්ගලිකත්වය සුරැකීමේ ප්‍රතිපත්ති ; සහ

(viii) මිල දී ගැනීමකට සම්බන්ධ ආරාවුල් සමථ කිරීමට සහ ප්‍රතිකර්මවලට අදාළ තොරතුරු ;

ඇතුළත් කුවිතාන්සියක් නිකුත් කළ යුතු ය.

(3) ගෙවීම් නියම

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් පාරිභෝගිකයන්ට ගෙවීම් සිදු කිරීමේ දී පහසුවෙන් භාවිත කළ හැකි යාන්ත්‍රණ ඇති කළ යුතු අතර අනවසර ප්‍රවේශ හෝ අනවසර පෞද්ගලික දත්ත භාවිත කිරීම, වංචා සහ අනන්‍යතා සොරකම්වලින් උද්ගත වන්නා වූ තත්ත්ව ද ඇතුළුව ගෙවීම් ආශ්‍රිත අවදානම්වලට සරිලන ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැළසිය යුතු ය.

(4) ප්‍රවාහනය සහ සැපයුම් සංවිධානය

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් -

(අ) පාරිභෝගිකයන්ට ගණුදෙණුවක් තහවුරු කරන ලෙස පැවසීමට පෙරාතුව භාණ්ඩ ප්‍රවාහන සේවා සහ මිල ගණන් පිළිබඳ තොරතුරුවලට අදාළ තොරතුරුවල ලුහුඬු සටහනක් සමාලෝචනය කිරීමට පාරිභෝගිකයාට අවස්ථාවක් ලබා දිය යුතු ය;

(ආ) පාරිභෝගිකයන් වෙත භාණ්ඩ ප්‍රවාහනය කරන විට, ඒ කාර්ය සඳහා විශ්වසනීය සැපයුම සේවා සපයන්නන් යොදා ගනිමින් අවස්ථාවෝචිත පරිදි, සැපයුම් සංවිධාන, විද්‍යුත් වාණිජ අස්ථිත්ව හෝ අන්තර්ජාතික වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවෙකු විසින් අදාළ ප්‍රවාහනය සිදු කළ යුතු ය;

(ඇ) කිසිදු ප්‍රමාදයකින් තොරව භාණ්ඩ ප්‍රවාහනයට පියවර ගත යුතු ය;

(5) අදහස් වෙනස් කරගැනීමේ කාල සීමා සහ ඇණවුම් අවලංගු කිරීමේ අයිතිය

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින් සුදුසු සහ ප්‍රායෝගික අවස්ථාවක දී, තහවුරු කරන ලද ගණුදෙනුවකින් ඉවත් වීමට පාරිභෝගිකයන්ට අවස්ථාවක් සලසා දිය යුතු ය.

(6) පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂා කිරීම.

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවෙකු විසින් -

(අ) පාරිභෝගිකයන්ගේ පෞද්ගලික දත්ත රැස්කිරීමට සහ භාවිත කිරීමට අදාළ කූඨ ක්‍රියාමාර්ගවලට සම්බන්ධ නොවිය යුතු ය;

(ආ) පාරිභෝගිකයන්ගේ දත්ත රැස්කිරීමට සහ භාවිතයට අදාළ එවැනි විද්‍යුත් වාණිජ අස්ථිත්වයක හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකුගේ පරිචයන් නීත්‍යානුකූල, විනිවිදභාවයෙන් යුතු සහ සාධාරණ, පාරිභෝගික සහභාගිත්වයට සහ කැමැත්තට සහ ප්‍රමාණවත් ආරක්ෂාවක් සලස්වන ඒවා බවට සහතික වෙමින් පාරිභෝගිකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම කළ යුතු ය;

(ඇ) පැහැදිලි, හොඳින් ප්‍රකටවන පෞද්ගලිකත්ව පිළිබඳ ප්‍රතිපත්ති ඇති කළ යුතු ය;

3. පශ්චාත් ගැණුම් අවධිය

(1) ප්‍රතිඥාහාර

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවෙකු විසින් -

(අ) විකිණිය හැකි භාණ්ඩයන් වන බවට ප්‍රතිඥාහාරය සහ විශේෂිත කාර්යයක් සම්බන්ධයෙන් යෝග්‍යතාවය පිළිබඳ ප්‍රතිඥාහාරය ද ඇතුළත් විය යුතු වන්නා වූ "වැයකළ මුදල් සඳහා සාධාරණ වටිනාකම" යන මූලධර්මය මත පදනම් වන වක්‍ර ප්‍රතිඥාහාරවලට යටත්ව යම් පාරිභෝගිකයෙකුට භාණ්ඩ විකිණිය හැකි ය;

(ආ) නිෂ්පාදනයක් ඒ තත්ත්වයෙන් ම විකුණන අවස්ථාවක දී, විකුණන අයිතමය යම් තැනැත්තෙකුට අන්තරාදායක වන හෝ පුද්ගලික හානියකට හේතුවන අයිතමයක් වේ නම්, එම භාණ්ඩය සම්බන්ධයෙන් වගකීමට යටත් විය හැකි ය;

(1) නිෂ්පාදනයක නිරුපද්‍රිතතාව

යම් විද්‍යුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවෙකු -

(අ) තුළ නිෂ්පාදන නිරුපද්‍රිතතා නියමය පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් පැවතිය යුතු අතර, ඒ නිරුපද්‍රිතතා නියම පාරිභෝගිකයාට හෙළිදරව් කරනු ලැබ ඇති බවට සහතික විය යුතු ය;

(ආ) විසින් විකුණන ලද භාණ්ඩ සම්බන්ධයෙන් ඇතිවිය හැකි නිරුපද්‍රිතතා ගැටලු විසඳීමේ දී පාරිභෝගිකයන්ට සහාය විය යුතු ය;

(ඇ) විසින් විකුණන ලද භාණ්ඩ සම්බන්ධයෙන් පාරිභෝගික පසු විපරම් යාන්ත්‍රණයක් ඇති කළ යුතු ය;

EOG 05 - 0127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.